www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුක්‍රේන යුද්ධය උග්‍ර වීමේ තර්ජනය

**The danger of escalation in Ukraine**

**2015 පෙබරවාරි 11**

පසුගිය සතියේ වොෂිංටනය නැටෝවට හිතවත් කියෙව්හි යුක්රේනියානු පාලනයට සෘජුවම අවි සපයන්නට ඉඩ තිබෙන බවට කරන ලද ප්‍රකාශයත් සමග එක්සත් ජනපද ආන්ඩුවේ ද එහි යුරෝපයේ සගයන්ගේ ද වාග්ප්‍රහාරය තව තවත් ඉව බව නැති කඨෝර භාවයක් අත්කරගෙන ඇත. මෙම යුදවාදී ප්‍රකාශයන් අතර තුර කිසිවෙකුත් මතු නොකරන ප්‍රශ්නය නම් යුක්රේනය මුල්කරගෙන වඩාත් පුලුල් යුද්ධයක් සිදුවුව හොත් එයින් නැසෙන්නට ඉඩ ඇති මනුෂ්‍ය ජීවිත සංඛ්‍යාව කොතරම් ද, එය කොතනින් සීමාවේ ද එය රුසියාව සහ නැටෝව අතර න්‍යෂ්ටික යුද්ධයක් කරා ම විහිදෙන්නේ ද යන කරුනු ය.

පසුගිය සති අග දී පැවැත්වුනු මියුනික් ආරක්ෂක සම්මේලනයේ දී, සෙනේට් මන්ත්‍රී ලින්ඩ්සි ග්‍රැහැම් කියා සිටියේ මහ යුද්ධයක් ඇතිවිය හැකි වුනත් වොෂිංටනය කියෙව් පාලනයට අවි සපයන බවයඃ "අප කියෙව් පාලනයට ආරක්ෂක අවි තොග ලබාදුන්නොත් මෙය කෙසේ හමාර වේ දැයි මා දන්නේ නැත. එහෙත් මම මෙය නම් දනිමිඃ "මගේ ජාතියට කුනුකන්දලට එරෙහිව නිදහස උදෙසා නැගී සිටීමට අවශ්‍යවූ කල්හි මම නිදහස සඳහා නැගී සිටියෙමි. ඔවුන් මිය යාමට ද පැරදීමට ද ඉඩ තිබේඃ එහෙත් මට කිව හැක්කේ. කවරෙකු හෝ වඩා හොඳින් මෙය පස්සට තල්ලු නොකලොත් අප සියලු දෙනාම පරාජයට පත්වනු ඇති බවයි."

පෝලන්ත පාර්ලිමේන්තු කථානායක රඩොස්ලැව් ස්කෝර්ස්කි යෝජනාකර සිටියේ රුසියාව භීතියට පත්ව දනගසන තෙක් යුද්ධමය තර්ජනය උග්‍ර කල යුතුය යන්නය. "යුක්රේනයට මිලිටරිමය වශයෙන් ජය ගත නොහැකි යයි පුටින් අපට පෙන්වා තිබේ. දැන් අප කල යුත්තේ ඔහුට ද මිලිටරිමය වශයෙන් දිනිය නොහැකි බවයි."

කියෙව් පාලනය ට අවි දිය යුතු යයි තර්ක කරන මූලෝපායික සහ ජාත්‍යන්තර අධ්‍යයන කේන්ද්‍රයේ චින්තන පර්ශදයේ වාර්තාවක් (සීඑස්අයිඑස්) මෙසේ පවසයි. "තමන් දේශපාලන සහ යුදමය ව්‍යසනයකට මුහුන දී සිටිනා බව මොස්කව් පාලනයට ඒත්තු ගැන්විය හැකි වන්නේ, සම්බාධක දැඩි කරන ගමන් පිලිගත හැකි පරිදි එක්සත් ජනපදය හා එහි සගයින්, යුක්රේනියානු මිලිටරිය ශක්තිමත් කිරීමට සිය කැපවීම ඔවුන්ට ඇඟවීමෙනි.. ."

තීරු රචක රොජර් කොහෙන් *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත් පතෙහි ලියා ඇත්තේ, රුසියාවට එරෙහිව යුක්රේනය අවි ගැන්වීම සඳහා ඩොලර් මිලියන ගනන් යට කරන ලෙස ය. "මොස්කව් වලට තේරෙන බාසාවක් ද තිබේඃ යුද ටැංකි නාශක මිසයිල, යුද බිමේ රේඩාර්, ඔත්තු බලන ඩ්රෝන් යානා. ඒවායින් පමනක් නොව තවත් අවි වලිනුත් යුක්රේන හමුදාව සවි ගන්වන්න. පුටින්ගේ වැය වාසි විග්‍රහය වැරදි බව ඔප්පු කරන්න. අවදානම් නැතුව නොවේ, එහෙත් අවදානම් නැති- "පිලිවෙතක් ඇත්තේ නැත."

එක්කෝ දේශපාලන සංස්ථාපිතය සහ මාධ්‍ය තමන්ගේ ම ප්‍රචාරයෙන් මත්ව ජනාකීර්න රඟහලක් තුල ඉඳ එය ගිනිගෙන ඇතැයි හඬ තැලීම බඳු ජාත්‍යන්තර රාජ්‍ය කූටෝපායකින් තමන්ට ගැලවී යා හැකි යයි රැවටී සිටිනවා විය හැකි යඃ නැතහොත් ඔවුන් කියන අදහස් කරනවා විය හැකිය. කෙසේ වෙතත් ඔව්හු, ඇත්තවශයෙන්ම යුරෝපා භූමියේ ජීවිත බිලියන ගනනක් බිලි ගන්නා නැටෝව සහ රුසියාව් අතර තාප න්‍යෂ්ටික යුද්ධයක් කරා මෝරා යා හැකි මහා ගොඩබිම් යුද්ධයක් කරා ගමන් කරමින් සිටිති.

එවන් ප්‍රකාශ කිරීමේ ඉලක්කය කුමක් වුවත්, මෙම තර්ජන වලට ඉලක්ක වූ රටවල්, ඒවා බැරෑරුම්ව ගනන් ගනිමින් සිටිති. ඊයේ ක්‍රෙම්ලිනයේ ආරක්ෂක මන්ඩලයේ ප්‍රධානී නිකොලයි පට්රුශේව් කියා සිටියේ, යුක්රේනයේ නැටෝ මැදිහත් වීම රුසියාවේ පැවැත්මටම එල්ල කරන ලද අභියෝගයක් ය කියායඃ "ඇමරිකානුවන් යත්න දරන්නේ රුසියානු ෆෙඩරේෂනය (සංයුක්ත රාජ්‍යය) අන්තර් රාජ්‍ය යුද්ධ ඝට්ටනයකට ඇදගෙන, යුක්රේනයේ සිද්ධීන් මගින් රුසියවේ රාජ්‍ය පෙරලියක් ඇති කොට අන්තිමේදී අප රට කැබලිති කර දැමීමටය" යයි ඔහු ප්‍රකාශ කලේ ය.

කියෙව් පාලනය අවිගැන්වීම කරා වොෂිංටනය ගමන් කලහොත්, "ඝට්ටනය තව දුරටත් උග්‍රවනු" ඇතැයි ව්ලැඩිමීර් පුටින්ගේ සමීපතරයෙකු වූ පැට්රුශේව් අනතුරු ඇඟවී ය.

කියෙව් පාලනය අවිගැන්වීමේ ඉලක්කය වන්නේ, ජීවිත මිලියන ගනනක් බිලිගන්නා විනාශකාරී නාගරික යුද්ධයකට රුසියාව පටලවා, දනගස්වා, එක්සත් ජනපදයට අභියෝග කලහැකි මහ බලවතෙකු ලෙස තවදුරටත් එහි පැවැත්ම බිඳ දැමීමට යයි කියා සිටින එක්සත් ජනපද මූලෝපායඥයෝ රුසියානු පාලන තන්ත්‍රයේ බිය තව තවත් අවුලුවති.

පසු ගිය වර්ෂයේ විල්සන් සෙන්ටර් චින්තන පර්ෂදය ඇමතූ, කාටර් පාලනාධිකාරයේ හිටපු ජාතික ආරක්ෂක උපදේශක ස්බිග්නිව් බ්‍රෙෂින්ස්කි රුසියාව තුල, "රුසියාවද ලෝක බලවතෙකැයි යන්න මහාභිලාෂය යුක්ති සහගත කරන දෘෂ්ටියක්... පැනනැගීම ට ඇති ඉඩ කඩ" ගැන අනතුරු ඇඟවීය. ඔහු විශ්වාස කරන පරිදි යුක්රේනය, මේ අන්දමින් ගත් කල රුසියාවට දිගුකාලීන ගැටලුවක් බවට පත්වනවා පමනක් නොව, මහ භූමි ප්‍රදේශයක්, ස්ථිරවම නැතිවී යාම ද අත් විඳිනු ඇත. එය වනාහි රුසියාව අධිරාජ්‍යයක් වශයෙන් ප්‍රසාරනය වීමට පටන්ගත් දා සිට විඳින්නට සිදුවූ ඉමහත් භූමි හානිය ද වනු ඇත. මෙහි විපාකයක් ලෙස ලෝකය තුල රුසියාවේ ස්ථානය හා භූමිකාව පිලිබඳ නව මිථ්‍යාප්‍රවාදාවලියට එරෙහිව ක්‍රියාත්මක වනු ද ඇත."

බ්‍රෙෂින්ස්කි මෙසේ ද පැවසීය, "යුක්රේනියානුවන් ආක්‍රමනයකට එරෙහිව සටන් වැදුනොත් ... , ඔවුන්ට අවි සැපයෙනු ඇති බව පිලිබඳව කල් තබාම, විවෘතවම දන්වා තිබීම වඩාත් හොඳවනු ඇත. මා සිතන සැටියට නම්, එම අවි, දහස් ගනන්, යුද ටැංකි සහිත අතිමහත් බලයක් යෙදවිය හැකි හමුදාවක් වන රුසියානු හමුදාව සමග විවෘත භූමියේ නොව, නාගරික ප්‍රතිරෝධක සටන් වල දී සාර්ථකව යොදාගත හැකි වන ආකාරයේ අවි විය යුතු ය."

බ්‍රෙෂින්ස්කි මෙසේ ද පැහැදිලි කලේ ය. "කිර්කිව් සහ කියෙව් වැනි ප්‍රධාන නගර ප්‍රතිරෝධය දක්වමින් වීදි සටන් වලට එලඹුනොත්, වීදි සටන් නැතිව බැරි වුනොත්, එය දීර්ඝ කාලීන වනු ඇත. වියදම් සහිත වනු ඇත. අදාල කාරනය නම්, මෙම සමස්ත අර්බුදයේ කාලය නියම කිරීම මෙහිදී වැදගත් තැනක් ගැනීම ය. මේ වර්ගයේ ප්‍රයත්නයකට රුසියාව තවමත් සූදානම් නැත. එය දරාගත නොහැකි ඉමහත් ලේ හැලීමක් ද, පක්ෂඝාතක ආර්ථික වියදමක් ද දැරීමට රුසියාවට බල කෙරෙනු අත.

යුද්ධය වනාහි මානව ක්‍රියාකාරිත්වයන්ගෙන් අතිශයින්ම පෙර නො දැකිය හැකි එක ය යන සංග්‍රාම විද්‍යාවේ මූලික ආප්තයකි.

යුක්රේනයේ ප්‍රධාන නගරවල මිලියන සංඛ්‍යාත ජනකායකගේ ජීවිත බිලි දෙන බ්‍රෙෂින්ස්කි විසින් ඉදිරිපත් කර ඇති සැලසුම්, ඉතා වේගයෙන් රුසියාව සහ නැටෝ හමුදා අතර ඍජු ඝට්ටනයකට මුල පුරන තත්වයක් පැන නගිනු ඇති ගනන් නැති විවිධ අවස්ථා අපට සිතා ගත හැකිය. බ්‍රෙෂින්ස්කි ගේ ක්‍රීඩා පුස්තකය අනුව යනවා වෙනුවට රුසියාව නැටෝ හමුදාවන්ට සහ බෝල්ටික් ප්‍රදේශය ද ඇතුලු නැගෙනහිර යුරෝපය පුරා, නැටෝ අනුගාමික රාජ්‍යයන්ට පහර දී ම කරා හැරෙන්නට ඉඩ ඇත. මේ තැන් වලට මැදිහත් වීමට නැටෝ ව ගිවිසුම් වලින් බැඳී සිටී. රුසියාව සාම්ප්‍රදායික අවි අතින් බෙහෙවින් ඉදිරියෙන් සිටින හෙයින් යුද්ධය මෙම ප්‍රදේශවලදී නැටෝ රාජ්‍යයන්ට අවාසි පැත්තට යන තත්වයක් උද්ගත වුවොත් නැටෝ ව න්‍යෂ්ටික අවි නොයොදා සිටී ද ?

ඉස්මතු වන ප්‍රශ්නය මෙයයි: නැටෝ බලවතුන්ගේ විදේශ ප්‍රතිපත්තියේ නිර්දය, ඉව බව නැති කමේ වෛෂයික මූලය කුමක් ද ? මීට පෙර අවසාන වතාවට මෙවන් ආක්‍රමනික පිලිවෙත් යොදාගත් බලවතුන් දෙදෙනා නම්, දෙවන ලෝක යුද්ධයට පෙරාතු නාසි ජර්මනිය සහ අධිරාජ්‍ය ජපානයයි. මේ පැනයන් දෙකම, ජීවිත කෝටි ගනනක් නසා දැමූ පිලිවෙත් අනුයමින් සිතිය නොහෙන දේ පරදුවට තැබීය. 1941 දී හිට්ලර් සෝවියට් සංගමයට කල ආක්‍රමනය වනාහි භයංකර විපාක ලබාදුන් උමතු සූදු කෙලියක් වී ය.

අවසාන විග්‍රහයේ දී, ජපාන සහ ජර්මානු පාලකයන්ගේ ක්‍රියාකලාපය වනාහි, ගැඹුරු පද්ධතිමය අර්බුදයක ට දක්වන ලද ප්‍රතිචාරයකි. තමන්ට හේතු යුක්ත විසඳුමක් නොතිබුනු අභ්‍යන්තර ආතතීන්ට මුහුන දුන් ෆැසිස්ට් පාලන තන්ත්‍ර, යුද්ධය මත සියල්ල පරදුවට තැබූ හ.

ඇමරිකා එක්සත් ජනපදයේ ඉවබව නැති පිලිවෙත ද හිට්ලර්ගේ සහ හිරෝහිතෝගේ පිලිවෙත ද අතර භයානක සමාන්තරයක් පවතී. ඉරාකයේ, සිරියාවේ, ලිබියාවේ සහ ඇෆ්ඝනිස්ථානයේ මුහුනදුන් ව්‍යසනයන් නොතකන, වොෂින්ටනයේ සිටිනා සවයං - මෝහිත නායකයෝ, ඇමරිකානු ධනේශ්වර ක්‍රමයේ සකල අසාධ්‍ය ගැටලුවක්ම දැවැන්ත පුපුරවා හැරීම් මගින් විසඳා ලිය හැකියයි විශ්වාස කරති. සංවිධිත මහාජන ප්‍රතිරෝධය මගින් වලකාලනු නොලැබුව හොත් මෙම ප්‍රචන්ඩ දුර්මතය මගපාදනු ඇත්තේ මහා ව්‍යසනයකට ම පමනි.

**ඇලෙක්ස් ලැන්ටියර්**

© www.wsws.org